මිරිස්ස තල්අරඹ වෙරළේදී අයිස් මත්ද්‍රව්‍ය තොගයක් නීතියේ රැහැනට හසුකර ගැනීම සම්බන්ධව

- ශ්‍රී ලංකා නාවික හමුදාව, වෙරළාරක්ෂක දෙපාර්තමේන්තුව, පොලිස් විශේෂ කාර්ය බලකාය සහ ශ්‍රී ලංකා ගුවන් හමුදාව එක්ව, මාතර, මිරිස්ස තල්අරඹ වෙරළ ප්‍රදේශය ආවරණය වන පරිදි, 2026 නොවැම්බර් මස 28 වැනි දින විශේෂ ඒකාබද්ධ සෝදිසි මෙහෙයුමක් සිදුකලා.
- එම මෙහෙයුමේදී අයිස් මත්ද්‍රව්‍ය අඩංගු බවට සැකකෙරෙන උර දහහතක් (17) මිරිස්ස තල්අරඹ වෙරළේදී අත්අඩංගුවට ගත්තා.
- එම මත්ද්‍රව්‍ය අඩංගු උර තොගය රැගෙන ආ බවට සැක කෙරෙන ඩිංගි යාත්‍රාවක් (01) සමඟ සැකකරුවන් දෙදෙනෙක් (02) පලා යාමට තැත් කිරීමේදි අත්අඩංගුවට ගැනීමට කටයුතු කලා.
- මෙම මත්ද්‍රව්‍ය තොගය ප්‍රවාහනය කිරීමට එම ස්ථානයට පැමිණි බවට සැකකෙරෙණ වැන් රථ දෙකක් (02) සමඟ එක් සැකකාරියක් (01) ද අත්අඩංගුවට ගෙන තිබෙනවා.
- මෙම මෙහෙයුමත් සමඟ 2026 වර්ෂයේ මේ දක්වා සිදුකළ මෙහෙයුම්වලදී මත්ද්‍රව්‍ය ප්‍රවාහනයට යොදාගත් යාත්‍රා 69ක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. ඒ අතර,

  - බහුදින ධීවර යාත්‍රා 11ක්.

  - විදේශීය යාත්‍රා 05ක්.

  - අනෙකුත් යාත්‍රා 53ක්.

  - එමෙන්ම දේශීය පුද්ගලයන් 368 දෙනෙකු සහ විදේශීය පුද්ගලයන් 21 දෙනෙකු ඇතුළුව පුද්ගලයන් 389 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඉදිරි නීතිමය කටයුතු සඳහා යොමුකර තිබෙනවා.

- 2026 වර්ෂයේ මේ දක්වා සිදුකළ මෙහෙයුම්වලදී,

  - හෙරෝයින් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් - 1686.887
  - අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් - 1051.330
  - කොකේන් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් - 256.200
  - හශිෂ් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් - 51.091 අත්අඩංගුවට ගෙන තිබෙනවා.

- නාවික හමුදාව රටම එකට මෙහෙයුම යටතේ රුපියල් බිලියන 116කට අධික (රු.කෝටි 11,600) මත්ද්‍රව්‍ය සහ 2026 වර්ෂයේ රුපියල් බිලියන 75කට අධික (රු.කෝටි 7,500) මත්ද්‍රව්‍ය අත්අඩංගුවට ගෙන තිබෙනවා.